ලෝකයේ සමස්ත ජනගහණයෙන් 15% ක පමණ පිරිසක්, එනම් බිලියන 1 ක පමණ ප්‍රමාණයක් යම් ආකාරයක ආබාධ සහිත තත්වයන් සමගින් ජීවත් වන බව ලෝක සෞඛ්‍ය සංවිධානය පවසයි. වර්තමානය වන විට, ආබාධ සහිතව ජීවත් වන්නවුන් යම් සමාජයන් තුළ කොන් කිරීමට, ගර්හාවට පාත්‍ර වීම සමගින්, එය මානව හිමිකම් සම්බන්ධ කරුණක් බවටද පත්ව තිබේ.

ආබාධ සහිතව ජීවත් වන පුද්ගලයින් හැඳින්වීමේදී ගර්හා විරහිත, කොන් නොකෙරෙන සහ ඔවුන්ගේ ගරුත්වය රැකෙන භාෂා භාවිතයක් අත්‍යවශ්‍ය වී ඇත්තේ ද ඒ හෙයිනි. එහිදී පුද්ගල-ප්‍රථම භාෂාවක් (Person-first language) යෝග්‍ය නොවන්නේදැයි Ethics Eye අප අසන්නේ ද එය පසුතල කරගනිමිනි.

මෙයට උදාහරණ ලෙස, "ගොළු" වැනි යෙදුම් භාවිතා වූ සිරස්තල කිහිපයක් අවධානයට ගත හැක (ජනවාරි 17, 2022 මව්බිම සහ ජනවාරි 18, 2022 දිවයින පුවත්පත්). "ගොළු" යන යෙදුමට සමානව ඉංග්‍රීසියෙන් භාවිතා වන Deaf-mute වැනි යෙදුම් යල් පැන ගොස් ඇති බව, මේ පිළිබඳ ජාත්‍යන්තර ක්‍රියාකාරීන්ගේ අදහසයි.

ඒ අනුව,

1) "ගොළු" වැනි යෙදුම් වෙනුවට, 'කථනාබාධ-ශ්‍රවණාබාධ සහිත පුද්ගලයෙකු' වැනි යෙදුමක් භාවිතය වඩාත් යෝග්‍ය වේ යැයි ඔබ නොසිතන්නේ ද?

2) "කථන ආබාධිත" වැනි යෙදුම් සඳහා පවා, පුද්ගලයාව මූලික කොට ගැනෙන හැඳින්වීමක් ලෙසින් ගත හැකි 'කථනාබාධ සහිත' වැනි යෙදුමක් වඩාත් පුද්ගල ප්‍රථම භාෂාවකට අනුකූල නොවන්නේ ද?

3) එසේත් නැතිනම් ඒ සඳහා 'පුද්ගල-ප්‍රථම' භාෂාවක පිහිටන වෙනත් යෝග්‍ය යෙදුම් ඔබට යෝජනා කළ හැකිද?

මූලාශ්‍ර:

http://www.disability.wa.gov.au/.../words_that_work_media...
https://ncdj.org/style-guide/
https://www.aucd.org/docs/add/sa_summits/Language%20Doc.pdf
https://www.who.int/.../fact.../detail/disability-and-health